# Voice Of Sri lankans

## VOS වසන්ත උදානය 2025 තරඟ නීතිරීති.

**1. තරඟය: බැළුම් පිපිරවීම.**
වයස :අවු.10න් පහළ දරු දැරියන් .
නීතිරීති :තරඟකරුවන් ආරම්භක ස්ථානයේ සිට බැළුම් ඇති ස්ථානයට දිව ගොස් බැලුමක් ගෙන එය පුම්බා,පුපුරුවා නැවත ආරම්භක ස්ථානයටම දුව ආ යුතුය .
අත්වලින් තෙරපීමෙන් හෝ කටුවලින් ඇන හෝ නියපොතුවලින් ඇන,බැළුම පිපිරවීම සපුරා තහනම්ය.
විනිශ්චය මණ්ඩලයේ තීරණය මත ජයග්‍රහකයන් තිදෙනෙක් තෝරා ගනු ලැබේ.

**2.තරඟය: බනිස් කෑම.**
වයස් සීමාව :අවුරුදු 12න් පහළ දරු දැරියන්.
නීතිරීති :අත් දෙක පිටිපසට බැඳගෙන ආරම්භක ස්ථානයේ සිට බනිස් එල්ලා ඇති ස්ථානයට දිව ගොස් බනිසය සම්පූර්ණයෙන් කා අවසන් කර නැවත ආරම්භක ස්ථානයටම දුව ආ යුතුය.
එසේ දිව ඒමේදී බනිස් කෑලි කටේ නොතිබිය යුතුය.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව එක් ජයග්‍රහකයෙක් තෝරා ගනු ලැබේ.

**3.තරඟය: අලියට ඇස තැබීම (ළමා)**
වයස් සීමාව :අවුරුදු 12න් පහළ දරු දැරියන් .
නීතිරීති :ඇස් දෙක බැඳගෙන ඇවිද ගොස්,ඉදිරිපස ලෑල්ලේ ඇති අලියාගේ රූපයේ නිවැරදිව ඇස ලකුණු කළ යුතුය .
සීමා ඉර පසු කළහොත් තරඟකරු තරඟයෙන් ඉවත් විය යුතුය.
තරඟකරුවෙකු තරඟ කරන අවස්ථාවේදී කිසිවෙකු ඔහුට අනුබල නොදිය යුතුය.
එක් තරඟකරුවෙකුට ඇස තැබිය හැක්කේ එක් වතාවක් පමණි.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව අලියාට ආසන්නවම ඇස තැබූ එක් ජයග්‍රහකයෙක් තෝරා ගනු ලැබේ .

**4.තරඟය: වාසනා මුට්ටිය බිඳීම**
වයස් සීමාව :අවුරුදු 12න් පහළ දරු දැරියන් .
නීතිරීති:තරඟකරුවා ඇස් බැඳගෙන සිටිය යුතුය.
ඔහු අතට ලබා දෙන පොල්ලත් සමග ඉදිරියට ගොස් එල්ලා ඇති මුට්ටිවලට පහර දිය යුතුය.
සීමා ඉර පසු නොකළ යුතුය.
මුට්ටි එල්ලා ඇති ආධාරකයේ හෝ මුට්ටිවල තරඟකරු ගෙනයන පොල්ල ස්පර්ශ නොවිය යුතුය.
තරඟකරුවෙකු තරඟ කරන අවස්ථාවේ කිසිවෙකු ඔහුට අනුබල නොදිය යුතුය.
එක් තරඟකරුවෙකුට තරඟ කළ හැක්කේ එක් වරක් පමණි.
මල් සහිත මුට්ටිය බිඳින පළමුවැන්නා තරඟය ජයග්‍රහනය කරනු ලබයි .
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි.

**5.තරඟය : සංගීත තොප්පිය(ළමා)**
වයස් සීමාව: අවුරුදු 12න් පහළ දරු දැරියන්
නීතිරීති :තරඟකරුවෙකු ,අනිත් තරඟකරු තම හිසට තොප්පිය දමන තෙක් තොප්පිය අතින් ඇල්ලීම තහනම් වේ.
තම හිසට තොප්පිය සම්පූර්ණයෙන් දැමූ පසු අතට ගෙන අනෙත් තරඟකරුගේ හිසට දැමිය යුතුය .
සංගීතය නවතින මොහොතේ,තොප්පිය හිස මත හෝ අතේ තිබෙන තරඟකරු තරඟයෙන් ඉවත් වේ.

අවසානය දක්වා තරඟයේ රැදෙන තරඟකරුවා,තරඟය ජයග්‍රහනය කරනු ලබයි.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

**6.තරඟය : බෝතලයට වතුර පිරවීම(ළමා)**
වයස් සීමාව:අවුරුදු 10න් පහළ දරු දැරියන්
නීතිරීති :කණ්ඩායම් වශයෙන් පැවැත්වෙන මෙම තරඟයේදී එක් කණ්ඩායමකට තරඟකරුවන් 3දෙනෙක් ඇතුළත් විය යුතුය.
එම කණ්ඩායම් තමන්ට රිසි සේ (ගැහැණු පිරිමි දරුවන් මිශ්‍රව)සාදා ගත හැක.
පළමු තරඟකරු පුරවා ඇති වතුර දෝතට ගෙන දිව ගොස් දෙවන තරඟකරුගේ දෝතට ලබා දිය යුතුය.
දෙවන තරඟකරු එම වතුර තෙවන තරඟකරුගේ දෝතට ලබා දිය යුතු අතර,එම තරඟකරු දිව ගොස් ඉදිරියේ ඇති බෝතලය පිරවිය යුතුය .
ප්‍රථමයෙන්ම බෝතලය පුරවන කණ්ඩායම ජයග්‍රහණය කරනු ලබයි .
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි.

**7.තරඟය :විවිධ ඇඳුම් තරඟය**
වයස් සීමාව:අවුරුදු 12න් පහළ දරු දැරියන්
නීතරීති:සෑම තරඟකරුවෙකුම කිසියම් නිරූපණයක් ඉදිරිපත් කළ යුතුය.
ඒ නිරූපණයත්,ඇඳුමත් සලකා බලා විනිශ්චයකාරවරුන් ලබා දෙන ලකුණ එකතු කිරීමෙන් ජයග්‍රහකයන් තිදෙනෙකු තෝරා ගනු ලැබේ .

**8.තරඟය:සිඟිති කුමාරිය තේරීම.**
වයස් සීමාව:අවුරුදු 8න් පහළ දැරියන් .
නීති රීති :දැරියන් රෙද්දකින් හා හැට්ටයකින් සැරසිය යුතුය.
කුසලතා පිළිබඳව,විශේෂ සැලකිල්ලක් දක්වනු නොලැබේ.
විනිශ්චයකාරවරුන් ලබා දෙන ලකුණු එකතු
කිරීමෙන් ජයග්‍රහකයන් තිදෙනෙකු තෝරා ගනු ලැබේ .

**9.තරඟය:සිඟිති කුමරා තේරීම.**
වයස් සීමාව :අවුරුදු 8න් පහළ දරුවන්.
නීතිරීති :තරඟකරු වන් සරමෙන් හා,කමිසයකින් සැරසිය යුතුය.
කුසලතා පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු නොලැබේ.
විනිශ්චයකාරවරුන් ලබා දෙන ලකුණු එකතු කිරීමෙන් ජයග්‍රහකයන් තිදෙනෙකු තෝරා ගනු ලැබේ .

**10.විවිධ ඇඳුම් තරඟයට** සහ,සිඟිති කුමරු,සිඟිති කුමාරි යන තරඟ සඳහා අංක(50බැගින්) සහ කටු අවශ්‍යය වේ.

**11.තරඟය :ගෝනි පැනීම(කාන්තා )**
වයස් සීමාව:අවුරුදු 10-15 අතර.
නීති රීති: තරඟකාරියන් ආරම්භක ස්ථානයේ සිට ගෝනි තබා ඇති ස්ථානය දක්වා දිව ආ යුතුය.
ඉන්පසු ගෝනියට බැස අවසන් ස්ථානය දක්වා යා යුතුය .
එක් ජයග්‍රහකියාවක් පමණක් තෝරා ගැනේ.

**12.තරඟය :ගෝනි පැනීම.පිරිමි**

වයස් සීමාව :අවුරුදු 10-15 අතර
නීති රීති:තරඟකරුවන් ආරම්භක ස්ථානයේ සිට ගෝනි තබා ඇති ස්ථානය දක්වා දිව ආ යුතුය.
ඉන්පසු ගෝනියට බැස අවසන් ස්ථානය දක්වා යා යුතුය.
එක් ජයග්‍රහකයෙක් පමණක් තෝරා ගනු ලැබේ .

**13.තරඟය:ගම හරහා දිවීම(කාන්තා )**
වයස් සීමාව :අවුරුදු 15න් ඉහළ .
නීති රීති :ධාවක පතයේ වට දෙකක් (මීටර් 800)දිවිය යුතුය.
පළමුවෙන් දිව එන තිදෙනා ජයග්‍රාහිකාවන් වනු ඇත.

**14.තරඟය:කඹ ඇදීම (කාන්තා)**
වයස් සීමාව:අවුරුදු 15න් ඉහළ
නීති රීති :එක් කණ්ඩායමකින් €15ක් අය කෙරේ .
එක් කණ්ඩායමකට තරඟකාරියන් 7දෙනෙකු ඇතුළත් විය යුතුය .
තරඟය ආරම්භ කිරීමෙන් අනතුරුව තරඟකාරියන් මාරු කළ නොහැක.
තරඟය ආරම්භ කිරීමෙන් අනතුරුව තවත් නව කණ්ඩායම් බඳවා ගනු නොලැබේ.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙනු ඇත .

**15.කඹ ඇදීම(පිරිමි)**
වයස් සීමාව:අවුරුදු 15න් ඉහළ
නීති රීති :එක් කණ්ඩායමකින් €15ක් අය කෙරේ.එක් කණ්ඩායමකට තරඟකරුවන් 7දෙනෙකු ඇතුළත් විය යුතුය .
තරඟය ආරම්භ කිරීමෙන් අනතුරුව තරඟකරුවන් මාරු කළ නොහැක.
තරඟය ආරම්භ කිරීමෙන් අනතුරුව තවත් නව කණ්ඩායම් බඳවා ගනු නොලැබේ.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වනු ඇත.

**16.තරඟය:කොට්ටා පොර (කාන්තා)**
වයස් සීමාව:අවුරුදු 15න් ඉහළ
නීති රීති :ඇඳ ඇති රවුමේ තනි කකුලෙන් සිටගෙන එක අතක් පිටිපසට කරගෙන සිටිය යුතුය.
අනෙක් අතින් කොට්ටය රැගෙන ප්‍රතිවාදියාට පහර දිය යුතුය .
කකුල මාරු කළ නොගැක.
අත ඉවතට ගත නොහැක.
සීමා ඉර නොපෑගිය යුතුය.
රවුමෙන් පිටතට නොයා යුතුය.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි.
ජයග්‍රාහිකාවන් දෙදෙනකු (පළවෙනි සහ දෙවෙනි ස්ථානවලට)තෝරා ගැනේ.

**17.තරඟය:කොට්ටා පොර (පිරිමි)**
වයස් සීමාව: අවුරුදු 15න් ඉහළ
නීති රීති:එක් අතක් පිටිපසට තබාගෙන අනෙක් අතට කොට්ටය රැගෙන ප්‍රතිවාදියාට පහර දිය යුතුය.
අත ඉවතට ගත නොහැක .
ආධාරකයෙන් බිමට වැටුණහොත් තරඟයෙන් ඉවත් කෙරේ.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන්තීරණය වෙයි .
ජයග්‍රහකයන් දෙදෙනකු (පළවෙනි සහ දෙවෙනි ස්ථාන සඳහා )තෝරා ගනු ලැබේ .

**18.තරඟය:Vos ගැමි පවුල තේරීම**
නීති රීති :දරුවන් සිටින යුවළකට සහභාගි විය හැක.
ශ්‍රී ලාංකික ඇඳුම්වලින් තරඟයට සහභාගී විය යුතුය.
විනිශ්චය මණ්ඩලයේ ලකුණු මත ජයග්‍රහාක පවුල  තීරණය වෙයි.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි.

**19.තරඟය:Vos අවුරුදු කුමරිය තේරීම**
වයස් සීමාව: අවුරුදු 15ත් ඉහළ තරුණියන්
නීති රීති:අවිවාහක තරුණියන් විය යුතුය.
රෙද්ද සහ හැට්ටය අනිවාර්ය වේ.
විනිශ්චය මණ්ඩලයේ ලකුණු අනුව ජයග්‍රාහිකාවන් තිදෙනෙකු තෝරා ගනු ලැබේ .
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි .

**20.තරඟය: බෝතලයට වතුර පිරවීම**
වයස් සීමාව:අවුරුදු 12ත් ඉහළ
නීතිරීති:එක් කණ්ඩායමකට තරඟකරුවන් තිදෙනෙකු අවශ්‍යය වේ.
තරඟකරුවන්ගේ අභිමතය පරිදි (ගැහැණු හා පිරිමි සංකලනයෙන්)තම කණ්ඩායම සාදා ගත හැක.
පළමු  තරඟකරු ලඟ ඇති බේසමෙන් දෝතට වතුර ගෙන,ඒ වතුර දෙවන තරඟකරුගේ දෝතට ලබා දිය යුතුය.
දෙවන තරඟකරු ,තෙවැනි  තරඟකරුගේ දෝතට ලබා දෙන වතුරවලින් ඉදිරිපස ඇති බෝතලය පිරවිය යුතුය .
පළමුවෙන් වතුර බෝතලය පුරවන කණ්ඩායම ජයග්‍රහක කණ්ඩායම වෙයි.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි .

**22.තරඟය:සැඟවුණු අමුත්තා සෙවීම**
වයස් සීමාවක් නොමැත .
නීති රීති:සැඟවුණු අමුත්තායයි සැකකරන පුද්ගලයා ළඟට ගොස්,තමන්ට ලබා දී ඇති කාඩ්පත පෙන්වා"සැඟවුණු අමුත්තා ඔබද"යන්න විමසිය යුතුය.
ඔහු සැඟවුණු අමුත්තානම් ඔහු සතු කාඩ්පත ඔබට පෙන්වනු ඇත.ඒ අනුව ජයග්‍රහකයා තෝරා ගනු ලැබේ .
මේ තරඟය සඳහා €1ක් අය කෙරේ.

**23.තරඟය:සැඟවුණු ඖෂධය සෙවීම**
නීති රීති :ඕනෑම අයෙකුට මෙම තරඟය සඳහා ඉදිරිපත් විය හැක.
ඔබ කළ යුත්තේ ඖෂධය කුමක්ද යන්න සඳහන් කිරීම පමණි.
ඖෂධය කුමක්ද යන්න ප්‍රථමයෙන් සඳහන් කර ඇති තැනැත්තා ජයග්‍රහණය කරනු ලබයි.(ඔබ තරඟය ට සහභාගි වූ වේලාව අනුව එය තීරණය කරනු ලබයි.)
මෙම තරඟයට €1ක් අය කරනු ලැබේ.

**24.තරඟය:කේක් ගෙඩියේ බර සෙවීම**
නීති රීති :වයස් සීමාවකින් තොරව ඕනෑම කෙනෙකුට මෙම,තරඟයට සහභාගි විය හැකිය .
ඔතා ඇති කේක් ගෙඩියේ ඔසවා බලා ඔබට බර සඳහන් කළ හැකිය .
කේක් ගෙඩියේබර ආසන්නව ප්‍රථමයෙන් සඳහන් කර ඇති තැනැත්තා තරඟයෙන් ජයග්‍රහණය කරනු ලබයි .(ඔබ තරඟයට සහභාගී වෙන වෙලාව අනුව එය තීරණය වෙයි.)

Voice Of Sri lankans

මෙම තරඟයට €1ක් අය කරනු ලැබේ.

**25.තරඟය;වට්ටක්කා ගෙඩියේ ඇට ගණන් කිරීම**
නීති රීති:ඔබ උපකල්පනය කරන පරිදි වට්ටක්කා ගෙඩියේ ඇට ගණන සඳහන් කළ යුතුය.
නිවැරදිව හෝ ආසන්න වශයෙන් වට්ටක්කා ඇට ප්‍රමාණය පවසන තැනැත්තා තරඟය ජයග්‍රහණය කරනු,ලබයි.(ඔබ තරඟයට සහභාගි වූ වෙලාව අනුව එය තීරණය කරනු ලැබේ)
මෙම තරඟයට €1ක් අය කරනු ලබයි .
*මෙම තරඟ හතරටම සහභාගී වෙන අයගෙන් €2ක් මුදලක් පමණක් අය කරනු ලැබේ.

**26.තරඟය:ගම හරහා දිවීම(පිරිමි)**
වයස් සීමාව: අවුරුදු 15න් ඉහළ
නීති රීති:ක්‍රීඩා පථයේ වට තුනක්((1200m) දිව යා යුතුය.ජයග්‍රහකයන් තිදෙනෙකු තෝරා ගනු ලැබේ .විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි .

**27.තරඟය:අලියට ඇස තැබීම**
වයස් සීමාව;අවුරුදු 12න් ඉහළ
නීති රීති :ඇස් බැඳ ඇවිද ගොස් ඉදිරිපස ලෑල්ලේ ඇති අලියාගේ රූපයේ නිවැරදිව ඇස ලකුණු කළ යුතුය.සීමා ඉර පසු කළහොත් තරඟකරු තරඟයෙන් ඉවත් විය යුතුය.
තරඟකරු තරඟ කරන අවස්ථාවේ කිසිවෙකු ඔහුට අනුබල නොදිය යුතුය.
එක්,තරඟකරුවෙකුට තරඟ කළ හැක්කේ එක් වතාවක් පමණි.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව අලියාට ආසන්නවම ඇස තැබූ එක් ජයග්‍රහකයෙක් තෝරා ගනු ලැබේ .

**28.තරඟය:ඉඳිකටුවට නූල දැමීම -යුගල**
වයස් සීමාව:15න් ඉහළ
නීති රීති:කාන්තාවක් සහ පිරිමියෙක් මෙම යුගල තරඟයට සහභාගී විය යුතුය.
කාන්තාව අත ඉඳිකටුවත්,පිරිමියා අත නූලත් තිබිය යුතුය.
නූලත් සමගම පිරිමියා දුව ගොස්,කාන්තාවගේ අත් නොඅල්ලා ඉඳිකටුවට නූල දැමිය යුතුය.
ඉන් පසු දෙදෙනා අත් අල්ලාගෙන ආරම්භක ස්ථානයටම දුව ආ යුතුය.
දිනුම් කණුවේදී ඉඳිකටුව තුළ නූල තිබීම අනිවාර්ය ව
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි .

**29.තරඟය:පොල් ගෑමේ තරඟය -යුගල**
වයස් සීමාව: 15න් ඉහළ (මෙම තරඟයට €1ක් අය කෙරේ)
නීති රීති :
මෙම තරඟයට කාන්තාවක් සහ පිරිමියෙකු ඇතුලත් විය යුතුය.
පොල් ගෙඩිය ඔවුන්ට තෝරා ගත හැකිය.
ඔවුන් විසින්ම පොල් ගෙඩිය බිඳ ගත යුතුය.
කාන්තාව විසින් තරඟය ආරම්භ කර පළමු බෑය ගා අවසන් වූ පසු පිරිමියා විසින් දෙවන බෑය ගා තරඟය අවසන් කළ යුතුය.
පොල් රැලි සිහින්ව තිබිය යුතුය.
කැබලි ඉලිප්පී නොතිබිය යුතුය.
කටුවේ පොල් ඉතිරි වී නොතිබිය යුතුය.

Voice Of Sri lankans

පළමුවෙන් තරඟය අවසන් කරන තිදෙනාගෙන් හොඳට පොල් ගා ඇති එක් කණ්ඩායමක් පමණක් ජයග්‍රහකයන්
වශයෙන් තෝරා ගනු ලැබේ .
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි

**30.තරඟය:වාසනා මුට්ටිය බිඳීම**
වයස් සීමාව:අවුරුදු 12න් ඉහළ
නීති රීති:තරඟකරු ඇස් බැඳගෙන සිටිය යුතුය.
ඔහුට ලබා දෙන පොල්ලත් සමග ඉදිරියට ගොස් එල්ලා ඇති මුට්ටිවලට පහර දිය යුතුය.
සීමා ඉර පසු නොකළ යුතුය.
මුට්ටි එල්ලා ඇති ආධාරකයේ හෝ මුට්ටිවල තරඟකරු ගෙනයන පොල්ල ස්පර්ශ නොවිය යුතුය.
තරඟකරුවෙකු තරඟ කරන අවස්ථාවේදී කිසිවෙකු ඔහුට අනුබල නොදිය යුතුය.
එක් තරඟකරුවෙකුට තරඟ කළ හැක්කේ එක් වරක් පමණි.
මල් සහිත මුට්ටිය බිඳින පළමුවැන්නා තරඟයෙන් ජයග්‍රහණය කරනු ලබයි.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි.

**31.තරඟය:පොල් අතු විවීම**
වයස් සීමාව:අවුරුදු 15න් ඉහළ කාන්තාවන්
නීතිරීති:පොල් අත්ත හිදැස් නොතිබිය යුතුය
දෙපැත්තේම මෝව්ට තිබිය යුතුය.
නිසියාකාරව ප්‍රථමයෙන් පොල් අත්ත වියන්නිය තරඟයෙන් ජයග්‍රහණය කරනු ලබයි
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි .
තරඟය:සූප්පුවෙන් බීම බීම .(එක් තරඟකරුවෙකුගෙන් €1ක් අය කෙරේ)
වයස් සීමාව:අවුරුදු 15න් ඉහළ පිරිමි නීති රීති:සූප්පුවේ සිදුර විශාල කළ නොහැක.
තරඟ කරන අවස්ථාවේ සූප්පුව බෝතලයෙන් ගැලවී ගියහොත් තරඟකරු තරඟයෙන් ඉවත් විය යුතුය.
පළමුවෙන් බීම සියල්ල බොන තැනැත්තා තරඟයෙන් ජයග්‍රහණය කරනු ලබයි .
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි.

**32.තරඟය:ගෝනි පැනීම**
වයස් සීමාව:15න් ඉහළ (කාන්තා )
නීති රීති:තරඟකරු වන් ආරම්භක ස්ථානයේ සිට ගෝනි තබා ඇති ස්ථානයට දිව ආ යුතුය.
ඉන්පසු ගෝනියට බැස අවසන් ස්ථානය දක්වා යා යුතුය .
එක් ජයග්‍රාහිකාවක් පමණක් තෝරා ගනු ලැබේ.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි.

**33.තරඟය:බාධක දිවීම**
වයස් සීමාව:අවුරුදු 15න් ඉහළ (පිරිමි)
නීති රීති:තරඟකරු ආරම්භක ස්ථානයේ සිට දිව ගොස් ඉදිරියේ ඇති කඹ තුළින් රිංගා යා යුතුය.
පසුව ඉදිරියේ ඇති වතුර භාජන දක්වා දිව ගොස් හොඳින් මුහුණ සෝදා ගත යුතුය.
ඉන්පසු ඉදිරියේ ඇති පිටි බඳුනේ ඇති දේ කටට ගෙන තබා ඇති ගෝනියට බැස අවසන් ස්ථානය දක්වා යා යුතුය .
තරඟය අවසන් වනතෙක් පිටි බඳුනෙන් සොයා ගත් දේ ඔබගේ කටේ තිබිය යුතුය.
එක්,ජයග්‍රහකයෙක් පමණක් තෝරා ගනු ලැබේ
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි .

**34.තරඟය:වතුර පිරවූ බැළුම පාස් කෙරීම-යුගල**
වයස් සීමාව:අවුරුදු 15න් ඉහළ
නීති රීති:ගැහැණු පිරිමි යුගලක් මෙම තරඟයට සහභාගී විය යුතුය .
තරඟය ආරම්භ කිරීමෙන් අනතුරුව බැළුම පිපිරීම,පැලීම,බිම,වැටීම,සීමා ඉර පසු කිරීම,ඉදිරියට පැමිණීම සපුරා තහනම් වේ.
වැඩිම දුරක් බැලුම, පාස් කර ගන්නා යුවළ ජයග්‍රහණය කරනු ලබයි .
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි.

**35.තරඟය:සංගීත බෝලය පාස් කිරීම .**
වයස් සීමාව:අවුරුදු 12න් ඉහළ
නීති රීති:බෝලය එකිනෙකාට දැමිය යුතුය.සංගීතය නවතින මොහොතේ බෝලය අතේ ඇති තැනැත්තා/තැනැත්තිය තරඟයෙන් ඉවත් විය යුතුය.
බෝලය
අනෙකාගේ අතේ වැදීම හෝ රැඳීම දක්වා වගකීම බෝලය යවන්නා සතු වෙයි.
බෝලය දමා ගැසීම හෝ වේගයෙන් දැමීම සපුරා තහනම්ය.
විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වෙයි .